ශ්‍රී ලංකාව යළිත් බෞද්ධ රාජ්‍යයක් වේවා!

කරුණාකර තුන් සූත්‍රය සජ්ඣායනා කොට
ශාසනාරක්ෂක මහේශාක්‍ය දේවසමූහයාට පින් දී,
මේ කවි උදේ සවස ශබ්ද නගා
කියවනු මැනවි.

ශ්‍රී ලංකාව යළිත් බෞද්ධ රජයක් වේවා!

සඟ සිරි වරෙක මේලෙස ය ගෙත ඇර පෑවා–
වගෙ සිරි සැපෙති බඳ වැඩි වැඩී බැබ ලේවා
නර සැරි දම් එළිය නෙදියත පැති රේවා
මෙම සිරි ලක යළිත් බෞද්ධ රජයක් වේවා!

සාධු සාධු සාධු

පැර කුම් ගැමුණු වැනි කළ තිලකා සේවා
නර පති කමට නිසි අය සුපහල වේවා
පර සතුරෙකුට කප් හිමි නොවගල් වේවා
වර සිරිලක යළිත් බෞද්ධ රජයක් වේවා!

සාධු සාධු සාධු

ම ගෙ මව් බිමට ඔබෙ මගෙ සේවය වේවා
ම ගෙ දූය සමය හිරු සඳු මෙන් බැබ ලේවා
ම ගෙ ඔබෙ බේදයක් අවුලක් නොම වේවා
ම ගෙ සිරිලංකා යළිත් බෞද්ධ රජයක් වේවා!

සාධු සාධු සාධු

ම ගෙ වැයම ද රට දූය රැකුමෙහි වේවා
ම ගෙ ජීවිතය එහිදූසී බැතිය ද වේවා
ම ගෙ රට දූය ලොවට වැඩ පිණිසම වේවා
ම ගෙ සිරිලංකා යළිත් බෞද්ධ රජයක් වේවා!

සාධු සාධු සාධු

මගෙ රට දැයම මගෙ ජීවිතය ද වේවා
මගෙ සඟරුවන නිති මගෙ පින් කෙත වේවා
මගෙ බුදු දහම රිවිකිරණසෙ පැති රේවා
මගෙ සිරිලක යළිත් බොදු රජයක් වේවා!

සාදු සාදු සාදු

තුරු ලිය මල් මලින් මල තුති ගී ගාවා
නව වසරකට සැරසෙන සිරියක් පෑවා
යටගිය අතීතය සමරන්නට පාවා
යළි සිරි ලංකාව බොදු රජයක් වේවා!

සාදු සාදු සාදු

සිරි පැරකුම් ගැමුණු නරවරයන්
සිරිලක නිතර සදහම් එළියෙන්
නැවතත් සැනසෙන්ට එ දහම් රස
යළි සිරි ලංකාව බොදු රජයක්

සාදු සාදු සාදු

ඉ පැරණි දඹුළු සීගිරි සිතුවම්
සෙන්කඩගල නුවර අනුරාපුර
ජාතික වස්තු ලෙස රැකගන්නට
යළි සිරි ලංකාව බොදු රජයක්

සාදු සාදු සාදු

ගාවා
නැවා
ගාවා
වේවා!

සේවා
මේවා
පාවා
වේවා!

ලොතරැයි රේස් සූදුව-රා සැල් සේවා
'ශඛාංක් ඓවිල් පාංචි' සිනමා නාටක මේවා
වලලා දැන්ට සදහට මළවුත් ගෑවිය
යළි සිරි ලංකාව බොදු රජයක් වේවා!

සාදු සාදු සාදු

ගව ගාතක නීති සොර අල්ලස් සේවා
මැරවර සුරා දුසිරිත් මූල්ලක බාවා
අසරණ සතුන් මරණින් මූදනට පාවා
යළි සිරි ලංකාව බොදු රජයක් වේවා!

සාදු සාදු සාදු

මිහිකත අමාරස දම් දියරින් — නාවා
මිසදිටු අඳුරු බිඳ ආලෝකය — ගාවා
මුළු ලෝකයට සාමය දෙන්නට — පාවා
යළි සිරි ලංකාව බොදු රජයක් — වේවා!

සාදු සාදු සාදු

නැවතත් පෙරදී මෙන් මේ රට සරු — වේවා
සාමය සමෘද්ධිය ඉන් මතු — වේවා
පාලක පිරිස දැහැමිම උදවිය — වේවා
මෙසේ සිරිලක යළිත් බොදු රජයක් — වේවා!

සාදු සාදු සාදු

(2495 සමස්ත ලංකා වෙසක් කාව්‍ය තරඟයෙන් උපුටා ගන්නා ලදී)

බුද්ධ ශාසනය බැබලේවා! සත්‍ය ධර්මය පැතිරේවා!!

ලෝක සාමය ඇතිවේවා!!!

"දේවෝ වස්සතු කාලේන - සස්සසම්පත්ති හේතුච
පීතෝ භවතු ලෝකෝච - රාජ භවතු ධම්මිකෝ"!

සිංහල බෞද්ධයෝ අවදිවෙත්වා!

ජයමංගල ගාථාව

සලිත් ශ්‍රී ලංකාවේ ජාතික ගීය වේවා!!

"බාහුං සහස්ස මභිනිම්මිත සායුධන්තං
ගිරිමෙඛලං උදිතඝොර සසෙන මාරං
දානාදි ධම්ම විධිනා ජිතවා මුනින්දො,
තං තෙජසා භවතු තෙ ජයමඞ්ගලානි"